# උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය

## අමාත්‍ය මණ්ඩල සංදේශය

<u>රහසයයි</u>

අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය : **HETI/HE/UD/2019/30**

<u>**නැඟී එන දකුණු හා නැගෙනහිර ආසියාවේ ආර්ථිකයන් ඉලක්ක කරගත් "නිදහස් අධ්‍යාපන ආයෝජන කලාපයක්" මෙරට ස්ථාපනය කිරීම**</u>

1. පසුබිම

ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුවේ පුරෝකථන වලට අනුව 2020 – 2030 දශකය දකුණු හා නැගෙනහිර ආසියාව ඉතා සීඝ්‍ර සංවර්ධනයක් සිදුවන ආර්ථික කලාපයක් ලෙස හඳුන්වා දිය හැක. එම කලාපයේ රටවල සිදුවන සීඝ්‍ර ආර්ථික සංවර්ධනය කරනකොට බිහිවන නව මධ්‍යම පාන්තික ජනගහනයේ දරුවන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා ඉලක්ක කොට යෝජිත "නිදහස් අධ්‍යාපන ආයෝජන කලාපයක්" මෙරට ස්ථාපනය කිරීම මඟින් ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ ජාත්‍යන්තර අධ්‍යාපනික කේන්ද්‍රය ලෙස පරිවර්තනය කළ හැකි බව මාගේ විශ්වාසයයි.

දකුණු ආසියාවේ සීඝ්‍රයෙන් නැගී එන ආර්ථිකයක් වන ඉන්දියාව ( ජනගහනය - බිලියන 01), බංග්ලාදේශය (මිලියන 180), පාකිස්ථානය ( මිලියන 218 ), ඇෆ්ගනිස්ථානය (මිලියන 38), මාලදිවයින (මිලියන.54 - වාර්ෂිකව උසස් අධ්‍යාපනය සඳහා 10,000ක් පමණ විදේශ ගතවේ.) මෙන්ම නැගෙනහිර ආසියාවේ ඉතා සීඝ්‍රයෙන් සංවර්ධනය වන ආර්ථිකයක් වන ඉන්දුනීසියාවේ ජනගහනය මිලියන 272 කි. එම ආර්ථිකයන් ප්‍රසාරණය වන විට එම රටවල මධ්‍යම පාන්තික ජනගහනයද ඊට සාපේක්ෂව වර්ධනය වන අතර,එම පවුල්වල දරුවන් සඳහා ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබාදීම දෙමාපියන්ගේ සිහිනයක් බවට පත්ව ඇත.

එහෙත්, බටහිර රටවල විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම ඉතා මිල අධික වන බැවින් හා එම රටවලට යන තම දරුවන් බොහෝවිට ආපසු තම රටවලට නොඒම මත, දෙමාපියන් මෙන්ම ඉහත රටවල රජයන්ද තම රටවල විදේශ විනිමය මෙන්ම බුද්ධිගලනය වළක්වා ගැනීමට බෙහෙවින් වෙහෙස දරනු ඇත.

එමෙන්ම, විශාල ශ්‍රී ලාංකික මධ්‍යම පාන්තික ජනතාවක් බටහිර සහ ආසියාතික රටවල පදිංචිව සිටින අතර, තම දරුවන් හට අඩු මිලක් යටතේ තම මව්රට තුළ ජාත්‍යන්තර කීර්තිමත් විශ්වවිද්‍යාලයක උසස් අධ්‍යාපන අවස්ථා මෙන්ම තම සංස්කෘතික හා ආගමික පරිසර යටතේ තුරුණු විය ගෙවීම පිණිස යොමු කිරීම හරහා "ශ්‍රී ලාංකික" අනන්‍යතාවයකින් යුත් දරුවෙකු නිර්මාණය කිරීම මෙන්ම, යෝජිත "පෝට්සිටි" වෙළඳ මූල්‍ය කේන්ද්‍රය හා යෝජිත නව "හම්බන්තොට ආර්ථික කලාපයේ" ඇතිවන රැකියා සඳහා තම දරුවන් ආපසු ශ්‍රී ලංකාව වෙත යොමු කිරීමේ අවශ්‍යතාවයන්ද ඉටුකර ගතහැකි වනු ඇත.

එමෙන්ම, අප අපේක්ෂිත ආර්ථික ඉලක්ක කරා රට යොමු කිරීමට නම් අප රට තුළද තොරතුරු තාක්ෂණ/කාර්මික හා කළමනාකරණ ක්ෂේත්‍රවල දැනුමැති ජාත්‍යන්තර මට්ටමේ මානව සම්පත් යොදා ගැනීමටද මෙම ක්‍රමවේදය මහඟු පිටුවහලක් වනු ඇත.

2. සාධාරණීකරණය

ඉහත කලාපීය වෙළඳපල ඉලක්ක මෙන්ම, මෙරට හැරගිය බුද්ධිමතුන්ගේ දරුවන් මෙන්ම එම බුද්ධිමතුන්ද නැවත මෙරටට ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රබල පිටුවහලක් වන යෝජිත " නිදහස් අධ්‍යාපන ආයෝජන කලාපය " කොළඹ අග නගරයට ආසන්න හොරණ - මිල්ලෑව ප්‍රදේශය ආශ්‍රිතව දැනටමත් නාගරික සංවර්ධන අධිකාරිය මගින් කර්මාන්ත කලාපයක් ස්ථාපනය කිරීම පිණිස අත්පත් කරගෙන එහෙත් පාරිසරික අභියෝග මත මතුව ඇති ප්‍රබල මහජන විරෝධය නිසා අතරමග නැවතී ඇති අක්කර 700 ක භූමි භාගය කේන්ද්‍ර කොට ආරම්භ කිරීමට යෝජනා කරමි.

මෙම " නිදහස් අධ්‍යාපන ආයෝජන කලාපය " ස්ථාපනය කිරීමේදී, 2000 දශකයේ මැලේසියානු රජය විසින් එරට " විශේෂ නිදහස් අධ්‍යාපන ආයෝජන කලාපය" ස්ථාපනය කිරීම සඳහා අනුගමනය කල විශේෂ ආකර්ෂණ ආයෝජන දිරි ගැන්වීම් මූලාශ්‍ර පදනම් කර ගැනීම මැනවැයිද යෝජනා කරනු රිසියෙමි.

3. නිර්දේශය

(අ) හොරණ මිල්ලෑව වත්ත ආශ්‍රිතව දැනටමත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගෙන ඇති අක්කර 700 ක භූමිය " විශේෂ නිදහස් අධ්‍යාපන ආයෝජන කලාපය " ලෙස නම් කිරීම.

(ආ) "යෝජිත විශේෂ නිදහස් අධ්‍යාපන කලාපය " ජාත්‍යන්තර කීර්තියට පත් විශ්වවිද්‍යාල ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(ඇ) යෝජිත විශේෂ අධ්‍යාපන ආයෝජන කලාපය ස්ථාපනය කරනු ලබන ජාත්‍යන්තර කීර්තිමත් විශ්වවිද්‍යාල පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා පැමිණෙන ආයෝජන සඳහා අවශ්‍ය විශේෂ බදු සහන ඇතුළු අනිකුත් ආකර්ශන සහිත පැකේජයක් හඳුන්වා දීම.

(ඈ) යෝජිත අධ්‍යාපන ආයෝජන කලාපය ස්ථාපනය කරනු ලබන විශ්වවිද්‍යාල සඳහා විදේශ මුදලින් ගෙවීම් කල හැකි විදේශ සිසුන් සහ නේවාසික නොවන ශ්‍රී ලාංකික සිසුන් සඳහා පමණක් ඉඩකඩ සැලසීම.

(ඉ) යෝජිත නිදහස් අධ්‍යාපන කලාපය ස්ථාපනය කරනු ලබන සියලුම විශ්වවිද්‍යාලවල වාර්ෂිකව සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රතිශතයෙන් 5% ප්‍රතිශතයක් නියත ලෙස " Z අගය " යටතේ ඉහළම උසස් පෙළ ප්‍රතිඵල ලබාගන්නා ශ්‍රී ලාංකික දරුවන් වෙත ශිෂ්‍යත්ව වශයෙන් ලබාදීමට නියම කිරීම.

( ඊ ) යෝජිත නිදහස් අධ්‍යාපන කලාපයේ ස්ථාපනය වන විශ්වවිද්‍යාල වල අධ්‍යයන කාර්ය මණ්ඩල මගින් මෙරට රජයේ විශ්වවිද්‍යාල පද්ධතියට අවශ්‍ය දැනුම හුවමාරුව යටතේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල විශ්වවිද්‍යාල මට්ටම සඳහා වන තාක්ෂණික සහාය ලබා ගැනීම.

(උ) ඉහත ආයෝජන කලාපයේ මූලික යටිතල පහසුකම් සම්පාදනය කිරීමට සමගාමීව, 2020 ජුනි මාසයේදි ජාත්‍යන්තරව කීර්තියට පත් විශ්වවිද්‍යාල ප්‍රධානීන් මෙරටට කැඳවා මෙම ආයෝජන අවස්ථා පිළිබඳව සම්මන්ත්‍රණයක් (Symposium) පැවැත්වීම.

4. අනුමැතිය

a) ඉහත (අ) සිට (උ) දක්වා වූ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහාත්,

b) යෝජිත " නිදහස් අධ්‍යාපන ආයෝජන කලාපය" ස්ථාපනය කිරීම සඳහා දැනට නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගෙන ඇති හොරණ මිල්ලෑව අක්කර 700 භූමිය උසස් අධ්‍යාපන අධ්‍යාපන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මඟින් කළමනාකරණ භාරයක් වෙත පැවරීම.

c) යෝජිත " නිදහස් අධ්‍යාපන ආයෝජන කලාපය" සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් වන, ප්‍රවේශ මාර්ග, විදුලි බල, අන්තර්ජාල, ජල සම්පාදන, පොදු ප්‍රවාහන පහසුකම් හා ක්‍රීඩා සහ නාගරික අවශ්‍යතා කඩිනමින්ම ස්ථාපනය කිරීම සඳහා වන " Master Plan " සකස් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සහ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ සහය ලබා ගැනීම පිණිස,

d) අදාල යටිතල පහසුකම් කඩිනමින් ස්ථාපනය කිරීම පිණිස 2020 වාර්ෂික අයවැය ලේඛනය යටතේ මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර දෙන ලෙස මහ භාණ්ඩාගාරයට නියම කිරීම පිණිස,

e) යෝජිත නිදහස් අධ්‍යාපන ආයෝජන කලාපයේ ආයෝජකයින් වන ලොව කීර්තිමත් විශ්වවිද්‍යාල 40 ක පමණ ප්‍රධානීන් කැඳවා ආයෝජන සම්මන්ත්‍රණයක් 2020 ජුනි මස පැවැත්වීම සඳහා අවශ්‍ය අරමුදල් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වෙන් කිරීම පිණිස මහා භාණ්ඩාගාරයට නියම කිරීම පිණිස,

ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කරමි.

ආචාර්ය බන්දුල ගුණවර්ධන
උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍ය

2019 දෙසැම්බර් 24 දින